# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment

මගේ අංකය / எனது இல / My No: DSD/HO/08/PM/04/E.Power- 2025
ඔබේ අංකය / உமது இல / Your No: ..........................................
දිනය / திகதி / Date: 2025.07. 18

සමෘද්ධි චක්‍රලේඛ අංක:- **2025/01**ට තුන්වන එකතුව

**සියළුම දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,**
**දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,**
**ප්‍රාදේශීය ලේකම්වරුන්,**
**දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන්,**

**<u>ප්‍රජා සවිබලගැන්වීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම - 2025</u>**
**<u>අස්වැසුම ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභී පවුල් සවිබලගැන්වීම සඳහා හඳුනා ගැනීම.</u>**

ප්‍රජා සවිබලගැන්වීම් වැඩසටහන - 2025 සම්බන්ධව මගේ සමාංක හා 2025.02.11 දිනැති සමෘද්ධි චක්‍රලේඛ අංක 2025/01 හා ඊට නිකුත් කළ පළමුවන හා දෙවන එකතුව මගින් උපදෙස් හා මඟපෙන්වීම් දැනට ලබා දී ඇත.

02. ඒ අනුව, සමෘද්ධි සහනාධාර ලැබූ අඩු ආදායම්ලාභී පවුල් හඳුනාගැනීම ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් අවසන් කර ඇති අතර, තවද, අස්වැසුම ප්‍රතිලාභ නාම ලේඛණ ලබා දුන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල එක් එක් ග්‍රාම නිලධාරී වසම්වල අස්වැසුම ප්‍රතිලාභී පවුල් හඳුනා ගැනීමද අවසන් කරමින් පවතින බව වාර්තා වී ඇත.

03. අස්වැසුම ප්‍රතිලාභී පවුල් අතරින්, 2025 වර්ෂය සඳහා සවිබලගැන්වීමට එක් එක් ග්‍රාම නිලධාරී වසමකින් පවුල් 38 ක් හඳුනා ගැනීම සඳහා අවශ්‍ය නාම ලේඛණය සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සුභසාධක මණ්ඩලය වෙතින් ලබා ගෙන දිස්ත්‍රික් වෙත ලබා දීමට නියමිතව තිබුනද, මෙම ලේඛන සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය වෙතින් ලබා ගැනීමේ ප්‍රමාදයක් ඇති වී ඇත.

04. එබැවින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අස්වැසුම ප්‍රතිලාභීන්ගේ නාම ලේඛන ලබා දීමේදී සිදු වන ප්‍රමාදයන් වළක්වා ගැනීම, පවුල් හඳුනාගැනීම කඩිනම් කිරීම හා වැඩසටහන ඉක්මනින් ආරම්භ කිරීම සඳහා ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල ඇති අස්වැසුම ප්‍රතිලාභ නාම ලේඛන භාවිතා කර සුදුසු පවුල් හඳුනා ගැනීමට නිලධාරීන් වෙත අවශ්‍ය උපදෙස් ලබා දීම සඳහා ඇමුණුම -01 සමඟ චක්‍රලේඛ උපදෙස් ලබා දෙන බව දන්වමි.

05. ග්‍රාම නිළධාරී වසම් වල සේවය කරන සමෘද්ධි සංවර්ධන නිළධාරීන් ඇතුළු අනෙකුත් නිළධාරීන් වෙත උපදෙස් හා මගපෙන්වීම් සිදු කරන ලෙස දන්වමි.

06. සැලසුම් කර ඇති පරිදි, පවුල් සවිබලගැන්වීමේ වැඩසටහන සාර්ථක කර ගැනීමට ඔබගේ සහාය අපේක්ෂා කරමි.

පී.කේ.එස්.සුභෝදිනි,
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන)
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

පිටපත්:-

1. ලේකම්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය -කා.දැ.ස
2. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව -කා.දැ.ස
3. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය -කා.දැ.ස
4. අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව -අ.ක.ස
5. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව -අ.ක.ස
6. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව -අ.ක.ස
7. සියළුම අංශ ප්‍රධානීන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව -අ.ක.ස
8. සියලුම මූලස්ථාන/ ප්‍රජාමූල බැංකු සමිති/බැංකු/ ව්‍යාපෘති කළමණාකරුවන් -අ.ක.ස
9. සියලුම සභාපතිවරුන්,ප්‍රජාමූල සංවිධාන -අ.ක.ස

ඇමුණුම - 01

**ප්‍රජා සවිබලගැන්වීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම - 2025**
**අස්වැසුම ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභී පවුල් සවිබලගැන්වීම සඳහා හඳුනා ගැනීම.**

01. **හැඳින්වීම.**

2025 වර්ෂයට සවිබලගැන්වීම සඳහා අස්වැසුම ප්‍රතිලාභ ලබන හා සමෘද්ධි සහනාධාර ලැබූ සියලු ප්‍රතිලාභීන් අතරින් පවුල් 400,000 ක් හඳුනාගැනීම, ඔවුන්ගේ මූලික තොරතුරු රැස් කිරීම හා පවුල් සංවර්ධන සැලසුම් සකස් කිරීම පිළිබඳ චක්‍රලේඛ උපදෙස් මඟින් දැනුවත් කර ඇත.

ඒ අනුව සමෘද්ධි සහනාධාර ලැබූ අඩු ආදායම්ලාභී පවුල් හා සමෘද්ධි සංවර්ධන දෙපර්තමේන්තුව විසින් අස්වැසුම ප්‍රතිලාභ නාම ලේඛන ලබා දුන් ප්‍රා දේශීය ලේකම් කොට්ඨාශවල ඉලක්ක පවුල් හඳුනා ගැනීම සිදු කර ඇත.

**තවද, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අස්වැසුම ප්‍රතිලාභ නාම ලේඛන ලබා නොදුන් ග්‍රාම නිලධාරී වසම්වල ප්‍රතිලාභී පවුල් 38 ක් හඳුනාගැනීම කඩිනම් කිරීම අත්‍යවශ වී ඇත. එබැවින් සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය හරහා ප්‍රතිලාභී ලේඛන ලබා ගැනීම ප්‍රමාද වන හෙයින්, ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය / දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතුව ඇති, එක් එක් වසමට අදාල අස්වැසුම ප්‍රතිලාභ නාම ලේඛන භාවිතා කර, එම ප්‍රතිලාභී පවුල් අතරින්, සුදුසුකම්ලත් පවුල් උපරිම 38 ක් හඳුනාගැනීම සඳහා කටයුතු කළ යුතු බව දන්වමි.**

**02.** **ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් අස්වැසුම ප්‍රතිලාභී පවුල් 38 ක් හඳුනා ගැනීම.**

**මෙහිදී, දැනට නිකුත් කර ඇති සමෘද්ධි චක්‍ර ලේඛ අංක 2025/01 හි ඡේද අංක 02 හි සඳහන් උපදෙස් සංශෝධනය කෙරේ.**

2.1. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් එක් එක් ග්‍රාම නිලධාරී වසම්වල අස්වැසුම ලබන ප්‍රතිලාභීන් අතරින් දරිද්‍රතා අනුපාතය (Poverty Rank) අනුව සකස් කළ නාම ලේඛන ලබා දීමේ ප්‍රමාදයක් සිදු වන බව දන්වමි.

2.2. සමෘද්ධි සංවර්ධන නිලධාරී විසින් තම ග්‍රාම නිලධාරී වසමෙහි අස්වැසුම නාම ලේඛනයේ නම් සඳහන් ප්‍රතිලාභීන් අතරින් සුදුසු පවුල් උපරිම 38 ක් හඳුනාගැනීම සිදු කළ යුතුය. මෙහිදී සමාජ ප්‍රතිලාභ කාණ්ඩය හා දරිද්‍රතා අනුපාතය අනුව ප්‍රතිලාභීන් හඳුනාගැනීම අවශ්‍ය නොවේ.
අස්වැසුම නාම ලේඛනය නිලධාරීන් භාරයේ නොමැති නම් අවශ්‍ය නාම ලේඛන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙතින් ලබා ගැනීම සිදු කළ යුතුය.

2.3. නිලධාරීන් විසින්, අස්වැසුම ප්‍රතිලාභී පවුල් හඳුනාගැනීමේදී සමෘද්ධි චක්‍රලේඛ අංක 2025/01 හි ඡේද අංක 04 හි සඳහන් අස්වැසුම ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ නිර්නායක සම්පූර්ණ කරන ප්‍රතිලාභීන් සවිබලගැන්වීම සඳහා තෝරා ගැනීම කළ යුතුය.

තවද, සමාංක DSD/HO/06/EP/01/චක්‍රලේඛ-2025 හා 2025.07.07 දිනැති සමෘද්ධි චක්‍රලේඛ අංක 2025/05 ට පළමු එකතුවට අනුව සමෘද්ධි අළෙවි සංවර්ධන වැඩසටහන - 2025 යටතේ හඳුනාගත් අස්වැසුම ප්‍රතිලාභී පවුල් ඇත්නම් මෙම චක්‍රලේඛ උපදෙස් අනුව හඳුනාගන්නා පවුල් 38 ඇතුලත් කර ගන්නා ලෙසත් තව දුරටත් දන්වමි. එහිදී අනුමත නිර්නායක සපුරා ඇති ප්‍රතිලාභී පවුල් විය යුතුය.

2.4. හඳුනාගනු ලබන ප්‍රතිලාභී පවුල් සඳහා ආකෘතිය-01 ආකෘති පත්‍රය භාවිතා කර මූලික තොරතුරු රැස් කිරීම සිදු කළ යුතුය. ආකෘති පත්‍ර සමෘද්ධි බැංකුව විසින් තම වියදමින් මුද්‍රණය කර නිලධාරීන්ට ලබා දිම සිදු කළ යුතුය.

2.5. ඉන් අනතුරුව, හඳුනාගත් ප්‍රතිලාභී පවුල් සඳහා ග්‍රාමීය කමිටුවේ එකඟතාවය ලබා ගැනීමට කටයුතු කල යුතුය. මෙහිදී සමාජිකයන් බහුතරයකගේ එකඟතාවය ලබා ගැනීම ප්‍රමාණවත් වේ. මෙහිදි චක්‍රලේඛ අංක 2025/01 ට පළමු එකතුවේ ඇමුණුම - 01 - A ආකෘතිය භාවිත කර නාම ලේඛනය පිළියෙල කර ග්‍රාමීය කමිටුවේ එකඟතාවය ලබාගත යුතුය.

2.6. පවුල් හඳුනාගැනීමේ කටයුතු 2025.07.31 වන දිනට පෙර අවසන් කිරීම අනිවාර්ය වේ.

2.7. ග්‍රාම නිලධාරී වසම්වල වැඩ බලන නිලධාරීන් සේවය කරන විටක මුල් චක්‍රලේඛනයෙහි ඡේද අංක 2.2 හි උපදෙස් අනුව ඉලක්ක පවුල් හඳුනාගැනීමට ඉඩ දෙනු ලැබේ.
තවද, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් මුළු ඉලක්ක පවුල් සංඛ්‍යාව ගනණය කිරීමේදී, අවශ්‍ය උපදෙස් සඳහා 2025/01 හි ඡේද අංක 2.3 පිළිපැදිය යුතුය.

2.8. දැනට සමෘද්ධි සහනාධාර ලැබූ අඩු ආදායම්ලාභී පවුල් හඳුනාගැනීමේ නාම ලේඛනයට අස්වැසුම ලැබීමට දැනට තේරී පත් වී ඇති පවුලක් සිටීනම්, එම ලේඛනයෙන් ඉවත් කර, මෙම නව හඳුනාගැනීමේ ලේඛනයට ඇතුලත් කර ගැනීමටද ඉඩ දෙනු ලැබේ. තවද, එම පවුල වෙනුවෙන් වෙනත් සුදුසු පවුලක් සමෘද්ධි සහානාධාර ලැබූ නාම ලේඛනයට ඇතුලත් කර ගැනීමට ද සිදු කළ යුතුය.

2.9. ආසියානු සංවර්ධන බැංකු, ලෝක බැංකු මූල්‍යාධාර යටතේ නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක වසම් සඳහා මෙම උපදෙස් අනුව තව දුරටත් පවුල් හඳුනාගැනීම සිදු නොකළ යුතුය.

2.10. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අස්වැසුම ප්‍රතිලාභ නාම ලේඛනය ලබා දුන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අයත් යම් ග්‍රාම නිලධාරී වසමක ඒ ඒ සමාජ කාණ්ඩයෙන් හඳුනාගත යුතු ඉලක්ක පවුල් නොමැති නම්, ආදාල වසමේ අස්වැසුම නාම ලේඛනයේ නම සඳහන් හා නිර්නායක සම්පූර්ණ කරන වෙනත් පවුල් සවිබලගැන්වීම සඳහා හඳුනා ගෙන ඉලක්ක පවුල් සම්පූර්ණ කළ හැකිය.

## 03. පවුල් සංවර්ධන සැලසුම් සකස් කිරීම.

මෙම උපදෙස් අනුව හඳුනාගෙන හා කමිටු එකඟතාවය ලබා ගත් ප්‍රතිලාභී පවුල් වෙනුවෙන් පවුල් සංවර්ධන සැලසුම් සකස් කිරීම කඩිනමින් සිදු කළ යුතු වන අතර, ඊට අදාල ආකෘති පත්‍ර මුද්‍රණය පිළිබඳ උපදෙස් ඉදිරියේදී දැනුම් දීමද සිදු කරන බව දන්වමි.

දැනට අස්වැසුම ප්‍රතිලාභී නාම ලේඛන ලබා දී ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල හඳුනාගත් ප්‍රතිලාභීන් සඳහා ජීවනෝපාය සංවර්ධන කටයුතු හා තරුණ තරුණියන් රැකියාගත කිරීමට අදාලව ක්‍රියාත්මක කළ යුතු වැඩසටහන් දී ඇති උපදෙස් අනුව ඉදිරියට සිදු කළ යුතු බවට ද තව දුරටත් දන්වමි.

## 04. Google Form තොරතුරු ඇතුලත් කිරීම.

දැනට හඳුන්වා දී ඇති Google Form සඳහා රැස් කරන ලද මූලික තොරතුරු ඇතුලත් කිරීම දී ඇති උපදෙස් අනුව සිදු කළ යුතුය. මෙම කාර්යයද 2025.08.15 දිනට පෙර ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් නිම කිරීමටද උපදෙස් ලබා දෙමි.

මෙම කාර්යය සඳහා ප්‍රමුඛතාවය ලබා දී කටයුතු කරන ලෙසත් කාරුණිකව දන්වමි.